# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13

## 2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි

( නව / පැරණි නිර්දේශය)

නාට්‍ය හා රංග කලාව - DMAT E1025

ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව

ප්‍රශ්න සංඛ්‍යාව : 10 කාලය : පැය 03 යි

ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

1. බෞද්ධාගමික පූජාකර්මයන්හි දිස්වන නාට්‍යමය ලක්ෂණ මොනවාදැයි නිදර්ශන දක්වමින් පහදන්න.

2. 'රිද්දි යාගය' පැවැත්වීමේ අරමුණු සඳහන් කරමින් එහි අඩංගු නාට්‍යමය ජවනිකා පිළිබඳ විමසීමක් කරන්න.

3. 'දහඅට සන්නිය' පිළිබඳ ව හැඳින්වීමක් කරමින් එහි එන 'සූනියම් යක්ෂණියගේ අවතාර තුන' නම් නාටයමය ජවනිකාව පිළිබඳ විස්තර දැක්වීමක් කරන්න.

4. උඩරට පළාතේ පවත්වනු ලබන ප්‍රධාන ශාන්තිකර්මය හඳුන්වා දෙමින් එහි එන නාට්‍යමය ජවනිකා මොනවාදැයි විස්තර කරන්න.

5. 'සොකරි' හඳුන්වා දෙමින්, සොකරි පිළිබඳ ව තිබෙන මතවාද විමසන්න.

6. 'කෝලම්' සහ 'දහඅට සන්නියේ' ඇති සමානකම් පෙන්වා දෙන්න.

7. 'නාඩගම්' හඳුන්වා දෙමින්, එයට මුල් වූ පුද්ගලයන් හා ඔවුන්ගේ නිර්මාණයන් පිළිබඳ ව විමසීමක් කරන්න.

8. 'නාඩගම්' පිරිහීමත් සමග ආරම්භ වන 'නූර්ති' පිළිබඳ ව සහ පසුව බිහි වන 'ටීටර්' පිළිබඳ ව හැඳින්වීමක් කරන්න.

9. 'මුහුදු පුත්තු' හා 'යේර්මා' නාට්‍යයන් පිළිබඳ ව සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.

10. සමකාලීන නිර්මාණ තුළ කොතෙක් දුරට දේශපාලනික තත්වයන් අන්තර්ගත වන්නේ දැයි නිදසුන් සපයමින් විමසීමක් කරන්න.

ශශශශශශශ N/P බබබබබබබ